විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

# පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

**1979** අංක **53** දරණ පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ජාතියේ නවෝත්පාදන හැකියාවන් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන වගකීම් දරණ ආයතනය වේ. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කොමිසම වර්තමානයේ කොමසාරිස්වරයෙකු සහ සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

කොමිසමේ පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) - (තනතුරු 01)- කොන්ත්‍රාත් පදනම මත**

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද -**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වාණිජවේදී/මූල්‍යකරණය/ගිණුම්කරණය පිළිබඳ උපාධිය

සමඟ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**තනතුරට පැවරෙන කාර්යයන් -**

මූල්‍ය කළමණාකරණයන් මෙහෙයවීම

**වැටුප් පරිමාණය -**

MM 1 – 2- 2025 - රු. 94,170 – 10 x 2,480 – 15 x 3450 – රු. 170,720

**අමතර ප්‍රතිලාභ -**

සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට පිළිවෙලින් **15%** හා **3%** දායකත්වයක් ලබා දේ.

**වයස් සීමාව -**

අවුරුදු **22 – 45** ත් අතර විය යුතු වේ. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පර්යේෂණ සහකාර (තනතුරු 01 ) - කොන්ත්‍රාත් පදනම මත**

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද -**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේදී / කළමණාකරණය/අලෙවිකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**තනතුරට පැවරෙන කාර්යයන් -**

* නව නිපැයුම්, නව නිර්මාණකරුවන් හඳුනා ගැනීමේ කටයුතු
* නව නිපැයුම් ප්‍රවර්ධනය කිරීමට සහාය වීම හා සම්බන්ධීකරණය
* විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති සංවිධානය, ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය
* නව නිපැයුම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සහාය හා ආයතන සම්බන්ධීකරණය
* තොරතුරු හා දත්ත රැස්කිරීම, විශ්ලේෂණය හා වාර්තා පිළියෙල කිරීම

**වැටුප් පරිමාණය -**

MA 3 – 2025 - Rs. 53, 940, - 10 x 800 -11 x 1190 - 10x1320- 5x1350 - Rs. 94,980

**අමතර ප්‍රතිලාභ -**

සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට පිළිවෙලින් **15%** හා **3%** දායකත්වයක් ලබා දේ.

**වයස් සීමාව -**

අවුරුදු **22 – 45** ත් අතර විය යුතු වේ. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන (තනතුරු 02)- කොන්ත්‍රාත් පදනම මත

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද -**

(අ) අධ්‍යන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

- **i.** සිංහල / දෙමළ
- **ii.** ගණිතය
- **iii.** ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**තනතුරට පැවරෙන කාර්යයන් -**

විධායක හා කළමණාකරණ කාර්යයන් හි නියැලි කාර්ය මණ්ඩලයේ කාර්යයන්ට උපස්ථම්භක වන පරිපූරක, පහසුකාරක හා සහය වන ලිපිකාර හා ගිණුම් කටයුතු.

**වැටුප් පරිමාණය -**

MA 1 – 1- 2025 - Rs. 46,220 – 10 x 540 – 7 x 630 – 4 x 890 – 20x 1190- Rs. 83,390

**අමතර ප්‍රතිලාභ -**

සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට පිළිවෙලින් **15%** හා **3%** දායකත්වයක් ලබා දේ.

**වයස් සීමාව -**

අවුරුදු **22 – 45** ත් අතර විය යුතු වේ. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමේ ක්‍රමය** : අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම්, අදාළ පළපුරුද්ද, වෘත්තීය ප්‍රවීණතා/ වෙනත් සුදුසුකම් සහ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව මත රඳා පවතී.

තමන් විසින් සකස් කර ගන්නා ලද ජීව දත්ත තොරතුරු සහිත ඉල්ලුම්පත් **2026.10.16** වන දිනට **හෝ** ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය සමඟ සියලුම සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත බහාලන ලියුම් කවරයේ **වම්පස ඉහළ කෙළවරේ** අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් සිය අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

කොමසාරිස්
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
**05** වන මහල,
“ මෙහෙවර පියෙස ” ගොඩනැඟිල්ල,
කොළඹ 05.
**www.slic.gov.lk**
**011-2676645**